# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2157/36 - 2020 ජනවාරි මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2020.01.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) වැනි ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද ප්‍රවාහන සේවා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යවරයා සහ දුම්රිය සේවා රාජ්‍ය අමාත්‍යවරයා සඳහා විෂයයන් හා කාර්යයන් පැවරීම, ප්‍රවාහන සේවා කළමනාකරණ විෂයයභාර කැබිනට් අමාත්‍යවරයා ලෙස මාගේ අධීක්ෂණයට, සහ මග පෙන්වීමට යටත්ව පිළිවෙලින් මෙහි පහත උපලේඛන I හා II හි සඳහන් පරිදි වහාම ක්‍රියාත්මක විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(5) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහින්ද අමරවීර,
ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍ය.

2020 ජනවාරි මස 08 වැනි දින.

උපලේඛනය I

**ගරු දිලුම් අමුණුගම මැතිතුමා,**
**ප්‍රවාහන සේවා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *I වන තීරුවේ සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා අදාළ වන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *අදාළවන නීති සහ අණ පනත්* |
| 1. මගී තොටුපොල සේවාවන් සැපයීම.<br>2. ආරක්ෂාකාරී කාර්යක්ෂම හා විශ්වාසනීය පොදු මගී ප්‍රවාහන සේවාවක් සැපයීම.<br>3. පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් හඳුන්වා දීම.<br>4. හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා වූ ප්‍රවාහන ක්ෂේත්‍රයේ දායකත්වය උදෙසා උපායමාර්ගික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 1. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය | • ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත (2005 අංක 27) |


1A - G 31784 — 392 (2020/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය II**

**ගරු සී. බී. රත්නායක මැතිතුමා,**
**දුම්රිය සේවා රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *I වන තීරුවේ සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා අදාළ වන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *අදාළවන නීති සහ අණ පනත්* |
| 1. නව තාක්ෂණය යොදා ගනිමින් ඒකාබද්ධ මගී සහ භාණ්ඩ දුම්රිය ප්‍රවාහන සේවා කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ දුම්රිය යටිතල පහසුකම් සංවර්ධනය හා ඉහළ ගුණාත්මක භාවයකින් යුතු දුම්රිය සේවා සැපයීම. | 1. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | • දුම්රිය පනත (1950 අංක 18) |
| 2. නව දුම්රිය මාර්ග ඉදි කිරීම, පවතින දුම්රිය මාර්ග නඩත්තු කිරීම, වැඩි දියුණු කිරීම සහ ඊට අදාළ ව ඉඩම් පවරා ගැනීම සහ යටිතල පහසුකම් සංවර්ධනය ඇතුළු සියළු කටයුතු | | |

01 - 599

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.